## පොසොන් මාසය

මේ පොසොන් මාසය ශ්‍රී ලාංකික අපට වැදගත් මාසයකි. එය එසේ වන්නේ අන්ධ ලෙස අදහන්නට නොව බුද්ධිමත් ලෙස පිලිපදින්නට හැකි දහමක් අපට ලැබුණේ මේ මාසයේ දී වන නිසා ය. අන්ධානුකරණය පිළිකෙව් කරන විචාර බුද්ධියට ඉඩ සදන දහමක් අපට ලැබුණේ මේ මාසයේ දී වන නිසා ය. බෞද්ධ දර්ශනයේ උත්තම හරය දෙවන තැනට ලා ආමිස පූජාව පෙරට ගෙන අප අද මේ යන ගමන ගැන නැවත සිතා බලන්නට මෙය කදිම මාසයක් නොවන්නේ ද?


**අපේ නව ලිපිනය**

22 Lorne Street
Lalor Vic 3075 Australia

Tel/Fax : 03 9402 5380



# සන්නස

**සංස්කරණය**

ජගත් ජේ එදිරිසිංහ
Jagath J Edirisinghe

**සංස්කරණ සහය**

ශ්‍රීනාත් මද්දුමගේ Srinath Maddumage
අසෝක සුබසිංහ Asoka Subasinghe

**සන්නස පිරිවර**

සිසිර දිසානායක
වි ක ධර්මබන්ධු
ආචාර්ය විද්‍යානි මනතුංග
ශ්‍රියාණි මද්දුමගේ
චන්දි මාපා
මහින්ද දිසානායක දිවුල්ගනේ
ශ්‍රියා කුමාරසිංහ

පිටු සැකසුම/ග්‍රැෆික් නිර්මාණ
ජගත් ජේ එදිරිසිංහ
Page Layout & Graphic Designs
Jagath J Edirisinghe

**සම්බන්ධීකරණය**

**NSW**
Lakshman Kodituwakku
02 9626 7660
02 9837 5055

**WA**
Kapila Hemantha Balage
08 9456 1972

**QLD**
Ananada Samaratunga
07 3372 7953

**ACT**
Asoka Nimalasiri
0439 925 241

**SA**
Chandta Eeriyagama

**TAS**
Anura Seneviratne
03 6327 4259

**Sannasa**
22 Lorne Street
Lalor Vic 3075 Australia
**Web: www.sannasa.net**
email : info@sannasa.net
sannasa@gmail.com
Tel/Fax : 03 9402 5380


පුවත්පතේ පලවන ලිපිවල අන්තර්ගතය ඒ ඒ ලේඛකයා/ලේඛිකාව ගේ අදහස් වන අතර ඒවායින් සංස්කාරකවරුන්ගේ අදහස් පිළිබිඹු නොවන බව සලකන්න සන්නස පුවත්පතින් උපුටාගත් බව සඳහන් කරමින් ඒවා උපුටා දැක්වීමට අවසර ඇත





# සර්ව පාක්ෂික සමුළුව නැවතත්
## තවත් කතා සාප්පුවක් ද?

***කවුරුන් කෙසේ සාකච්ඡා කළද රටේ අනාගත පැවැත්මට පවා බලපාන මෙවන් තීරණාත්මක ප්‍රශ්නයකට විසඳුම් සොයා ගැනීම හෝ නොගැනීම තීරණය වන්නේ උතුරෙත් දකුණෙත් දේශපාලන බලවේග කොතෙක් දුරට පරිත්‍යාග කිරීමට සූදානම් වන්නේද කොතෙක් දුරට නම්‍යශීලි හා ප්‍රායෝගික වන්නේද යන්න මතය.***

**රජය** සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර සාකච්ඡා සම්බන්ධයෙන් දකුණේ දේශපාලන පක්ෂ අතර එකඟතාවයක් ඇතිකර ගැනීම සඳහා රැස්වන සර්ව පාක්ෂික සමුළුවේ තවත් එක් සමුළු වාරයක්, පසුගිය සිකුරාදා (02 දා) ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී පැවැත්වුණි.
මෙවර පැවැත්වූයේ පස්වන සර්ව පාක්ෂික සමුළුව වේ. මෙතෙක් පැවැති සර්ව පාක්ෂික සමුළුවලට වඩා මෙවර සර්ව පාක්ෂික සමුළු මාතෘකාව තරමක වෙනස් ස්වභාවයක් ගත්තේය. පක්ෂවලට කළ ඇරයුම එසේ විය. සටන් විරාම ගිවිසුම ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර ජිනීවා හි පැවැති සාකච්ඡාවට අදාළව සාකච්ඡා කර දකුණේ දේශපාලන පක්ෂ අතර එකඟතාවයක් ඇති කර ගැනීම, පෙර පැවති සමුළු හතරේ පරමාර්තය වූ අතර රජය සහ එල්.ටී.ටී.ඊ. සංවිධානය අතර ජිනීවා හි සාකච්ඡා පැවැත්වීමට පෙරත් ඉන් පසුවත් එම සර්ව පාක්ෂික සමුළු වාර කිහිපය පැවැත්වුණි.

එහෙත් මෙවර පැවැති පස්වන සර්ව පාක්ෂික සමුළු වාරය තරමක වෙනස් ස්වභාවයක් ගැනීමට හේතු වූයේ පෙර පැවති සර්ව පාක්ෂික සමුළුවාර හතරේදී අවධානයට ගත් මාතෘකාවට වඩා මෙවර වාර්තාගතව වෙනස්වීමය. ජාතික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් ලබාදීම සම්බන්ධයෙන් සාකච්ඡාවට ගෙන එලෙස ලබාදිය යුතු විසඳුම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුව නියෝජනය කරන දකුණේ සියළු දේශපාලන

*කාශ්‍යප මල්ලවාරච්චි*

පක්ෂවලින් අදහස් විමසීම එහි අරමුණ විය. තවද මෙරට ජනවාර්ගික ප්‍රශ්නයට උපරිම අයුරින් බලය බෙදාහරින අපේම වූ විසඳුමක් ලබාදීම සම්බන්ධයෙන් තමන්ගේ අවධානය යොමුව තිබෙන බව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා දැනට සති කිහිපයකට පෙර සති අන්ත පුවත්පතක් සඳහා පළමු වරට පවසා තිබුණි. අනතුරුව අවස්ථා කිහිපයකදීම ජනාධිපතිවරයා ඒ බව ප්‍රකාශ කළේය. මෙවර සර්ව පාක්ෂික සමුළුවට පෙර හෙතෙම එවැන්නක් පවසා තිබීම අවසන්වරට පැවති සර්ව පාක්ෂික සමුළුවට සහභාගි වන දේශපාලන පක්ෂවල නායකයන්ටද යම් ඇඟවීමක්ව තිබුණි. සාම මහලේකම් කාර්යාලය මෙවර දේශපාලන පක්ෂ වෙත ඇරයුම් කළ ලිපියේද ඒ බව සඳහන්ව තිබුණි. දෙමළ ජාතික සන්ධානය සමඟ ජනාධිපතිවරයා වෙනම සාකච්ඡා පවත්වන බැවින් මෙවරද එම සන්ධානයට ඇරයුම් නොලැබුණි. ඊට පෙර දින එනම් පසුගිය බ්‍රහස්පතින්දා (01 දා) රාත්‍රී අරලියගහ මන්දිරයේ පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මධ්‍යම කාරක සභා රැස්වීමේදීද හෙතෙම ඒ බව ප්‍රකාශ කළේය. ශ්‍රීලනිප මධ්‍යම කාරක සභිකයන් දැනුවත් කරමින් අදහස් දක්වා තිබූ ජනාධිපතිවරයා පසුදා එනම් 02 දා පවත්වන සර්ව පාක්ෂික සමුළුවේ ජනවාර්ගික ප්‍රශ්නයට දේශපාලන විසඳුමක් සොයා ගැනීම සඳහා දේශපාලන පක්ෂවලින් අදහස් විමසන බව පැවසීය.

සර්ව පාක්ෂික සමුළුව අරඹමින් සිය අදහස් පළකළ ජනාධිපතිවරයා ජනවාර්ගික ප්‍රශ්නයට නොබෙදුණු ලංකාවක් තුළ උපරිම ලෙස බලය බෙදාහරින අපේම වූ විසඳුමක් සොයා ගැනීමට අදහස් කර ඇති බැවින් ඒ පිළිබඳව පක්ෂවල අදහස් දක්වන ලෙස ඉල්ලා සිටියේය. එහිදී අදහස් දැක්වූ මෙරට විපක්ෂයේ ප්‍රධාන දේශපාලන පක්ෂය වන එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක කරු ජයසූරිය මහතා, බලය බෙදාහැරීම පිළිබඳව විදෙස් අත්දැකීම්ද ඇසුරු කර ගනිමින් අපේම වූ විසඳුමක් සොයාගත හැකි බවත් ඒ සඳහා සිය පක්ෂය සහය පළ කරන බවද පැවසීය. එසේ වුවද උතුරු නැගෙනහිර පළාත්වල උද්ගතව ඇති ගැටුම්කාරී හා අවිනිශ්චිත වාතාවරණය මඟහරවා ගැනීමට ප්‍රමුඛතාවයක් දී කටයුතු කළයුතු බව හෙතෙම එහිදී පෙන්වා දුන්නේය.

ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් එහිදී අදහස් දැක්වූ එම පක්ෂ